සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

07 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

කාලය පැය දෙකකි

නම / විභාග අංකයඃ-..............................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න
- 1 - 4 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් පද්‍ය ඇසුරෙන් පිළිතුරු සපයන්න

A. අහසින් අවුත් මිණි අක් නයිදු යැදුමට
රහතන් මැදෙහි මුණි හිඳ මිණි පලඟ පිට........

B. කැමට කැදරකම් නොකරන්නේ
තව මට කියමින් කෑ නොගසන්නේ........

C. උද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රී කුමාරි බඳී
දේවෝපකාර වේවා සැදී සෙත්

D. කටේ කිරි සුවද යන්නට පවා බැරි වුනා
යුදට උපන් කුමරා යැයි නමක් ඇති වුනා

(01) සිරිත් මල්දමේ කවිය ඇතුලත් අක්ෂරය වනුයේ

(1) A (2) B (3) C (4) D

(02) ටිකිරි කුමරු හා සම්බන්ධ ඓතිහාසික කතා පුවතට අදාල ගීත ඛණ්ඩය අයත් අක්ෂරය වන්නේ

(1) A (2) B (3) C (4) D

(03) නූර්ති ගීතයක් ඇතුලත් අක්ෂරය වන්නේ

(1) A (2) B (3) C (4) D

(04) කැළණි වෙහෙර ඉදි වූ ආකාරය පිළිබඳ කියැවෙන පද්‍ය වන්නේ

(1) A (2) B (3) C (4) D

- 5 - 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(05) ශිථිලකරණය යන්නෙන් අදහස් වන්නේ

(1) ශරීරය උණුසුම් කිරීම (2) ශරීරය සැහැල්ලු කිරීම

(3) වචන භාවිතා නොකර හැඟීම් ප්‍රකාශ කිරීම (4) හඬ උච්ඡාරණ අභ්‍යාසයි

(06) මෙම රූපයේ දැක්වෙන නාට්‍ය නිෂ්පාදකවරිය වන්නේ,

(1) සෝමලතා සුබසිංහ

(2) ලලිතා සරත්චන්ද්‍ර

(3) සුමිත්‍රා පීරිස්

(4) මානෙල් ජයසේන



(07) ''නම් පොත'' භාවිතයෙන් වර්ධනය කරගත හැකි රංගන හැකියාව වන්නේ,

(1) පෙළ රචනයයි
(2) කතන්දර ගෙතීමයි
(3) රිද්මයානුකූල නර්තනයයි
(4) උච්චාරණ හැකියාවයි

(08) වර්තමානයේ බහුලව භාවිත වන රංග භූමිය වන්නේ,

(1) කමත
(2) කරලිය
(3) පින්තූර රාමු වේදිකාව
(4) කවාකාර වේදිකාව

(09) නාට්‍යයේ තේමාව යනුවෙන් අදහස් කරන්නේ,

(1) කථා වස්තුවයි
(2) ප්‍රධාන අදහසයි
(3) ජවනිකා හෙවත් අංක
(4) නාට්‍යමය අවස්ථා

(10) වේදිකා නාට්‍යයක ලක්ෂණයක් නොවන්නේ,

(1) සජීවී බව
(2) සාමූහික කලාවකි
(3) චිත්‍රාගාරයක් තුල රූගත කරයි
(4) ප්‍රේක්ෂකයා උදෙසා නිර්මාණය කරයි

- අංක 11 - 15 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) වැරදි නම් (✗) ලකුණද යොදන්න

(11) නාට්‍යකින් කියැවෙන පරිසරය මැවීමට ස්වාභාවික ලෝකයේ ඇති වස්තූන්ගේ හැඩතල, වර්ණ භාවිතා කල හැකිය ( )

(12) රූපවාහිනිය ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් නොවේ ( )

(13) රංග අභ්‍යාස සබකෝලය දුරු කිරීමට ඉවහල් වේ ( )

(14) අවස්ථා නිරූපණය, රස වින්දනය මෙන්ම ජීවිතාවබෝධය සඳහා උපකාර වේ ( )

(15) අභිරූපණයේදී වාචික අභිනය පිළිබඳ වඩාත් සැලකිලිමත් විය යුතුය ( )

- අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුලින් තෝරා ලියන්න

(අනුශාංගික , පරිකල්පනය , අභිනය , රංග භූමිය , ක්ෂණික නිරූපණ)

(16) නාට්‍ය කලාවේ ප්‍රධාන මාධ්‍ය...........................................නම් වේ

(17) පිටපතකින් හෝ පුහුණුවකින් තොරව කරන රංගනය................................................... ලෙස හැඳින්වේ

(18) වේදිකාවේ දකින ආලෝකකරණය, පසුතල, වේෂභූෂණ ආදිය..................................................අංග ලෙස හැඳින්වේ

(19) යමක් අලුතින් සිතීම හා මැවීම....................................................වේ

(20) රංගනයක් ඉදිරිපත් කරන ඕනෑම ස්ථානයක්......................................................ලෙස හඳුන්වයි

(ලකුණු 2×20)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**07 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - II පත්‍රය**

නම / විභාග අංකයඃ-...............................................................

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න

(01) පහත සදහන් දෙබස් කණ්ඩය කියවා අසා ඇති ප්‍රශ්න සදහා පිළිතුරු සපයන්න

| | | |
|---|---|---|
| දොස්තර මාමා | : | කවුද ලෙඩා |
| යාළුවෝ | : | මෙන්න ලෙඩා |
| දොස්තර මාමා | : | මොනවද දැන් අමාරු? |
| අම්මා | : | කිසිම දෙයක් කන්නේ නෑ |
| 1 යාළුවා | : | කිසිම දෙයක් බොන්නේ නෑ |
| අම්මා | : | කිසිම දෙයක් නැතුව අදට දවස් පහක් වෙනවා |
| දොස්තර මාමා | : | දවස් පහක් (පුදුමයෙන්) |

(1) මෙම සංවාද කණ්ඩය ඇතුලත් නාට්‍යයේ නම ලියන්න (ලකුණු 2)

(2) ඉහත දෙබස් කණ්ඩය ඇතුලත් නාට්‍ය පිටපත රචනා කොට නිෂ්පාදනය කරනු ලැබුයේ කවුරුන්දැයි නම් කරන්න (ලකුණු 2)

(3) මෙම නාට්‍යයේ ඇතුලත් සත්ව චරිත 2ක් හා මිනිස් චරිත 2ක් නම් කරන්න (ලකුණු 4)

(4) මෙහි දැක්වෙන රංග විධානයක් ලියන්න (ලකුණු 3)

(5) මෙම නාට්‍යයෙන් ලබා ගත හැකි ආදර්ශ 2ක් ලියන්න (ලකුණු 4)

(02)

(1) අභිනය යනු කුමක්දැයි හදුන්වන්න (ලකුණු 3)

(2) අභිනයේ ප්‍රභේද කීයද? ඒවා නම් කරන්න (ලකුණු 6)

(3) ඉන් එක් අභිනයක් විස්තර කරන්න (ලකුණු 6)

(03)

(1) රංග අභ්‍යාස යනු කුමක්දැයි කෙටියෙන් හදුන්වන්න (ලකුණු 3)

(2) ඔබ දන්නා රංග අභ්‍යාස 2ක් ලියන්න (ලකුණු 4)

(3) ඉන් එක් රංග අභ්‍යාසයක් පන්ති කාමරයේදී කළ ආකාරය පියවරෙන් පියවර ලියන්න (ලකුණු 8)

(04)

(1) වේෂභූෂණ යනු මොනවාද? (ලකුණු 3)

(2) වේෂභූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 2ක් ලියන්න (ලකුණු 4)

(3) රජු හා බිසව සඳහා අවශ්‍ය වේෂභූෂණ රූප සටහනක් මගින් ඇඳ නම් කරන්න (ලකුණු 8)

(05) අතීතයේ ගැමි නාටක සඳහා ඉතා අලංකාර වෙස් මුහුණු භාවිතා කර ඇත

(1) පන්ති කාමරයේදී ඔබ වෙස් මුහුණු සැකසීම සඳහා යොදා ගත් අමු ද්‍රව්‍ය 4ක් නම් කරන්න (ලකුණු 4)

(2) වෙස් මුහුණු පැළඳගෙන රංගනයේ යෙදෙන විට ලැබෙන වාසි 2ක් ලියන්න (ලකුණු 4)

(3) පන්ති කාමරයේදී ඔබ විසින් වෙස් මුහුණු සකස් කළ ආකාරය විස්තර කරන්න (ලකුණු 7)

(06) ඔබ කැමති ඓතිහාසික කථා පුවතක් ඇසුරින් කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න

චරිත

දෙබස් / සංවාද

රංග විධාන

ගැටුම් අවස්ථා සහිතව (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**07 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (01) 2 | (06) 1 | (11) ✓ | (16) අභිනය |
| (02) 4 | (07) 4 | (12) ✗ | (17) ක්ෂණික නිරූපණය |
| (03) 3 | (08) 3 | (13) ✓ | (18) අනුශාංගික |
| (04) 1 | (09) 2 | (14) ✓ | (19) පරිකල්පනය |
| (05) 2 | (10) 3 | (15) ✗ | (20) රංග භූමිය |

## II පත්‍රය

(01)

(1) අමර ගියා දිව්‍යලෝකේ

(2) පාලිත ලොකුපෝතාගම

(3) සත්ව චරිත - පූසා , බලුරාල

මිනිස් චරිත - අම්මා , අමර , යාළුවෝ , දොස්තර , සුරංගනාවියෝ

(4) (පුදුමයෙන්)

(5) නාට්‍යයෙන් ගම්‍යවන ආදර්ශ පාඨ ලියා ඇත්නම් ලකුණු දෙන්න

(02)

(1) ඉදිරියට පැමිණ වීම , ප්‍රේක්ෂකයන් ඉදිරියේ ඉදිරිපත් කිරීම

(2) 4යි

ආංගික , වාචික , සාත්වික , ආහාර්ය

(3) ලියා ඇති අභිනය සලකා ලකුණු ලබා දෙන්න

(03)

(1) රංගනය සඳහා පුහුණුවන කාලයේ සිදු කරන අභ්‍යාස

(2) 1.ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස

2.ශිථිලකරණ අභ්‍යාස

3.හඬ අභ්‍යාස

(3) ලියා ඇති ආකාරය සලකා ලකුණු ලබා දෙන්න

(04)

(1) නළු ඇඳුම් පැළඳුම්

(2) 1. නාට්‍යයට ගැලපීම

දේශයට (නාට්‍යයෙන් නිරූපිත)

යුගයට (නාට්‍යයෙන් නිරූපිත)

2. නාට්‍ය පෙළේ චරිතවලට ඍජු වීම

3. රූපණයේදී අපහසුවක් ඇති නොවීම

(3) ඇඳ ඇති ආකාරය හා චරිතවලට ගැලපෙනවාදැයි බලා ලකුණු ලබා දෙන්න

(05)

(1) කාඩ්බෝඩ්, බයින්ඩර් ගම්, කෝඩ් නූල් වැනි ඕනෑම ද්‍රව්‍ය 4ක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

(2) සබකෝලය දුරු වීම

ස්ථාවරභාවයකින් රංගනයේ යෙදීමට හැකිවීම

(3) ඔබ සමග වෙස් මුහුණු සකස් කළ ආකාර සලකා ලකුණු ලබා දෙන්න

(06) චරිත ගොඩනැගීම - (ලකුණු 4)

දෙබස් / සංවාද - (ලකුණු 4)

රංග විධාන - (ලකුණු 3)

ගැටුම් අවස්ථා - (ලකුණු 4) සහිතව සරල නාට්‍ය පිටපතක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න